# මධ්‍යම මහේස්ත්‍රාත් අධිකරණය මගින්
# Federal Magistrates Court of Australia
# සංක්‍රමණ තීන්දු විමර්ශනය කිරීම

## මේ විස්තර පත්‍රිකාව කා සඳහාද ?

මේ විස්තර පත්‍රිකාව වීසා සම්බන්ධ තීන්දුවක් මධ්‍යම මහේස්ත්‍රාත් අධිකරණය (Federal Magistrates Court) -අධිකරණය- මගින් විමර්ශනයට භාජනය කිරීමට අවශ්‍ය පුද්ගලයින් සඳහාය.

## අධිකරණයට විමර්ශනය කළ හැක්කේ කෙබඳු තීරණයන්ද ?

*1958 සංක්‍රමණ පනත (Migration Act 1958)* යටතේ එළඹෙන ලද සමහරක් තීන්දු අධිකරණයට විමර්ශනය කළ හැක. සංක්‍රමණ පනත යටතේ තීන්දු දීම සම්බන්ධයෙන් වගකිවයුතු පුද්ගලයන් අතරට සංක්‍රමණ හා පුරවැසිභාවය පිළිබඳ අමාත්‍යවරයා සහ සරණාගත විමර්ශන සභාවේ (Refugee Review Tribunal) සහ සංක්‍රමණ විමර්ශන සභාවේ (Migration Review Tribunal) සාමාජිකයින් ඇතුලත් වේ.

අධිකරණය යම් තීන්දුවක් විමර්ශනයට භාජනය කරනු ඇත්තේ යම්කිසි අධිකරණ බලය සම්බන්ධ වරදක් ('jurisdictional error') සිදුවී ඇත්ද යන්න නිර්ණය කිරීමට පමණි. එනම්, අධිකරණය නිර්ණය කරනුයේ යම් තීන්දුවකට එළඹ ඇත්තේ නීතියට අනුකූලවද යන්න වේ.

## අධිකරණයට කළ හැක්කේ කුමක්ද ?

ඔබේ විමර්ශන අයැදුම සාර්ථක නම්, තීන්දුව සම්බන්ධයෙන් වගකිවයුත්තන් වෙත ඔබේ අයැදුම් පත නැවත යොමු කිරීමට අධිකරණයට හැකිවේ. තීරණය සම්බන්ධයෙන් අමාත්‍යවරයා ක්‍රියාකිරීම වැළැක්වීමටද අධිකරණයට හැකියාවක් ඇත.

## අධිකරණයට කළ නොහැක්කේ කුමක්ද ?

ඔබේ අයැදුමේ ගුණාත්මක භාවය සහ ඔබට වීසා බලපතක් ප්‍රදානය කළ යුතුද නැද්ද යන්න නැවත සළකා බැලීමට අධිකරණයට නොහැක.

## අධිකරණය ස්වාධීන ආයතනයක්ද ?

ඔව්. අධිකරණය සංක්‍රමණ පනත යටතේ තීන්දුවලට එළඹෙන්නන්ගෙන් ස්වාධීනය.

## අයැදුම් කළ හැක්කේ කාහටද ?

ඔබ තීන්දුව සම්බන්ධයෙන් නොසතුටට පත්ව ඇත්නම් හා අධිකරණ බලය සම්බන්ධ වරදක් සිදුවී ඇති බවට විශ්වාස කරයි නම් ඔබට අධිකරණය වෙත අයැදුම් කළ හැකිය. අයැදුම් පතක් ගොනු කිරීමට පෙර ඔබ නීති උපදෙස් ලබාගත යුතුය.

## අධිකරණයේ නඩු ඇසීම පුද්ගලිකද ?

සාමාන්‍යයෙන් අධිකරණයන්හි නඩු ඇසීම මහජනතාවට විවෘතය. ඔබේ අයැදුම්පත සරණාගත වීසා සම්බන්ධ තීන්දුවක් නම් ඔබේ අනන්‍යතාවය හෙළි කිරීමට අධිකරණයට හැකියාවක් නැත.

## කාලසීමා අදාල වේද ?

ආගමන අයැදුම්පත සම්බන්ධ තීන්දුව දැනුම් දීමෙන් දින 35 ක් ඇතුලත ඔබ නැවත විමර්ශනයක් සඳහා අයැදුම් කළ යුතුය. විශේෂ අවස්ථාවන්හිදී අධිකරණය කාල සීමාව දීර්ඝ කරනු ඇත. ඔබට කාලය දිර්ඝ කිරීමක් අවශ්‍ය නම් එය අයැදුම්පතේ ඉල්ලා සිටිය යුතු අතර අවශ්‍යවන්නේ ඇයිද යනවග පැහැදිලි කළ යුතුවේ.

## මා හට අවශ්‍ය පෝරම මොනවාද ?

තීන්දුවක් විමර්ශනය කරවා ගැනීම සඳහා අයැදුම් කිරීමට ඔබ පහත දෑ සම්පූර්ණ කළ යුතු වේ.

- අයැදුම් පත්‍රයක්, සහ
- දිවුරුම් ප්‍රකාශයක් (affidavit)

මේ ලියකියවිලි **www.fmc.gov.au** වෙතින් හෝ අධිකරණ රෙජිස්ට්‍රාර් කාර්යාලයයෙන් (court registry) ඔබට ලබාගත හැකිය.

තීරණයට එළඹි තැනැත්තා විසින් කරන ලද අධිකරණ බල උල්ලංඝනය කුමක්ද යන්න ඔබේ අයැදුම් පතින් පෙන්වා දිය යුතුවේ. ඔබේ දිවුරුම් ප්‍රකාශයේ ඔප්පු කිරීමට බලාපොරොත්තු වන වරද පිළිබඳ අදාල සියළු කාරණා සහ අවස්ථානුගත තත්වයන් ඔබ විසින් පැහැදිලි කළ යුතුවේ. විමර්ශනය කළ යුතු තීන්දුවේ පිටපතක් සහ තීන්දුව සඳහා හේතු කාරක වූ ප්‍රකාශයන් ඔබේ දිවුරුම් ප්‍රකාශයට ඇමිණිය යුතුවේ.

## මා පෝරම භාරදිය යුත්තේ කා හටද ?

සම්පුර්ණ කිරීමෙන් පසුව ඔබේ අයැදුම්පත සහ එය සනාථ කරන ලියකියවිලි අධිකරණයේ ගොනු කල යුතුවේ. ගොනු කිරීමෙන් පසුව ඔබේ අයැදුම් පත සහ එය සනාථ කරන ලියකියවිලි වල මුද්‍රා තබන ලද පිටපතක් අමාත්‍යවරයාට සහ බොහෝවිට ඔබේ තීන්දු වට එළඹුනු විමර්ශන සභාවට භාර දිය යුතුවේ. මේ ක්‍රියාවලිය ලේඛණ භාරදීම (service of documents) ලෙස නම් කෙරේ.

අමාත්‍යවරයාට ලියකියවිලි භාරදීම සංක්‍රමණ සහ පුරවැසිභාවය පිළිබඳ දෙපාර්තමේන්තුව (Department of Immigration and Citizenship) -දෙපාර්තමේන්තුව- හරහා සිදු කළ හැකිය.දෙපාර්තමේන්තුවේ කාර්යාලයයන් සෑම ප්‍රධාන නගරයකම පිහිටා ඇත. ලිපිනය පිළිබඳ තොරතුරු **www.immi.gov.au** වෙත පිවිසීමෙන් හෝ අංක **131 881** මගින් දෙපාර්තමේන්තුව ඇමතීමෙන් ලබාගත හැක.

## නඩුව ඇසීමේදී සිදුවන්නේ කුමක්ද ?

අධිකරණය ඔබේ නඩුව ඇසීම සඳහා දිනයක් වෙන් කරනු ඇත. පළමුවන අධිකරණ දිනයේදී අධිකරණය පහත දෑ සම්බන්ධයෙන් නියමයන් හා යොමු කිරීම් සිදු කරනු ඇත:

- කඩිනම් නඩු ඇසීමක්
- දෙවැනි හෝ අවසාන නඩු ඇසීමේ දිනයක්
- ස්ථාවර හෝ අතුරු (තාවකාලික) නියෝගයක්
- සංශෝධිත හෝ අමතර ලියකියවිලි ගොනු කිරීම

අවසාන නඩු විභාගයට පෙර අධිකරණය විසින් කඩිනම් නඩු ඇසීමක් හෝ දෙවැනි නඩු ඇසීමක් පිළිබඳ නියෝගයක් කරන්නට නම් විවාදයට උචිත නඩුවක් (arguable case) ඇති බව පෙන්වීමට ඔබට සිදුවනු ඇත. ඔබට විවාදයට උචිත නඩුවක් ඇති බව පෙන්වා දිය නොහැකි වුවහොත් අධිකරණය ඔබේ අයැදුම් පත අවසාන නඩු ඇසීමකින් තොරව නිශ්ප්‍රභා කරන්නට ඉඩ ඇත.

සෑම නඩු වාරයකදීම ඔබේ නඩුවට සම්බන්ධ ගැටළු සම්බන්ධයෙන් පිළිතුරු දීමට අධිකරණය ඔබට අවස්ථාවක් සළසනු ඇත. ඔබට නීතීඥවරයකු සිටී නම් ඔවුන් ඔබ වෙනුවෙන් කථා කරනු ඇත. සාමාන්‍යයෙන් අමාත්‍යවරයා නීතීඥවරයකු මගින් නියෝජනය කෙරෙනු ඇති අතර ඔවුන් විසින් අධිකරණයේ පවසන දෑ සම්බන්ධයෙන් ප්‍රතිඋත්තර දීමට ඔබට හෝ ඔබේ නීතීඥවරයාට අවස්ථාවක් ලැබෙනු ඇත. අධිකරණයට සහභාගී වීමෙන් ඔබ නිදහස් කොට ඇත්නම් හැර නඩු ඇසීම් වාරයන් ඇති සෑම විටකම ඔබ අධිකරණයට පැමිණිය යුතුවේ.

අන්තිම නඩු වාරය අවසානයේදී අධිකරණය සමාන්‍යයෙන් තම තීන්දුව ප්‍රකාශයට පත් කරනු ඇත. නොඑසේනම් අධිකරණය තීන්දුව ප්‍රකාශ කරන දිනය ඔබට දැනුම් දෙනු ඇත.

## භාෂණ පරිවර්තකයන් ලබා ගන්නේ කෙසේද ?

අංක **131 450** මගින් පරිවර්තන දුරකථන සේවාව ඇමතීමෙන් ඔබට අධිකරණය හා සම්බන්ධ විය හැකිය. නඩු ඇසීම් වාරයේදී පරිවර්තන සඳහා භාෂණ පරිවර්තකයකු අවශ්‍ය නම් එය ඔබේ අයැදුම් පතේ සඳහන් කළ යුතුය.

## මා විසින් මුදල් ගෙවීමක් කළ යුතුද ?

ඔබේ අයැදුම් පත ගොනු කරන අවස්ථාවේ ඔබ ගාස්තුවක් ගෙවිය යුතු වන අතර අවසාන නඩු විභාගය සඳහා තවත් අමතර ගාස්තුවක් ගෙවිය යුතුවේ. සමහර නඩු සම්බන්ධයෙන් ගාස්තු අදාල නොවේ. ගාස්තු පිළිබඳ ඔබට වැඩිපුර යමක් දැන ගැනීමට අවශ්‍ය නම් අධිකරණයේ ලේඛකාධිකාරී කාර්ය මණ්ඩලය අමතන්න.

අධිකරණය ඔබේ අයැදුම් පත නිශ්ප්‍රභා කරයි නම් ඔබට දෙපාර්තමේන්තුවේ නීති ගාස්තු ගෙවීමට බොහෝ විට සිදුවෙනු ඇත. ඇසීම් වාරයන් නොමැතිව ඔබේ නඩුව ඉල්ලා අස්කර ගැනීමට ඔබ තීරණය කරයි නම් ඔබට දෙපාර්තමේන්තුවේ නීති ගාස්තු අඩු ප්‍රමාණයක් ගෙවීමට සාමාන්‍යයෙන් සිදුවනු ඇත.

## මාහට නඩුව ඉල්ලා අස්කර ගත හැකිද ?

ඔව්. ඔබේ අවසාන නඩු විභාගයට දින 14කට වඩා අඩු කාලයක් ඇත්නම් නඩුව ඉල්ලා අස්කර ගැනීමට අධිකරණයේ අවසර ලබාගත යුතුවේ.

## මා හට නීති උපදෙස් අවශ්‍යද ?

ඔබේ අයැදුම්පත සම්බන්ධයෙන් නීති උපදෙස් ලබාගැනීම හැකි ඉක්මනින් කළ යුතුය. ඔබට නීති ආධාර කාර්යාලයයකින් හෝ ප්‍රජා නීති මධ්‍යස්ථානයකින් උපදෙස් යම් ප්‍රමාණයක් නොමිළේ ලබාගත හැකි වනු ඇත. නොඑසේනම් ඔබට ඔබේ නීතීඥවරයා තෝරා ගැනීමට සහ සේවය සම්බන්ධයෙන් මුදල් ගෙවීමටද සිදුවනු ඇත.

මේ පත්‍රිකාව සාමාන්‍ය තොරතුරු පමණක් සපයන අතර නීති උපදෙස් ලබා නොදේ. ඔබට නීති ප්‍රශ්නයක් උද්ගත වී ඇත්නම් කළ යුත්තේ කුමක්ද යන්න තීරණය කිරීමට හෝ අධිකරණයට ඉල්ලුම් කිරීමට පෙර නීතීඥවරයකු මුණගැසිය යුතු වේ. මධ්‍යම මහේස්ත්‍රාත් අධිකරණයට (Federal Magistrates Court) නීති උපදෙස් ලබාදිය නොහැක.